07 ඇන්තූරියම්, ඕකිඩ්, රෝස ඇතුළු කැපුම් මල් හා විසිතුරු මල්, විසිතුරු පත්‍රීය ශාක වලින් සමන්විත වියළි කලාපීය මල් උයන

08 වැඩිදියුණු කළ හා සාම්ප්‍රදායික පොල් ප්‍රභේද රාශියකින් යුත් නෙරළු උයන

09 ආහාර නිෂ්පාදනය දිරිගැන්වීමේ අරමුණින් වාණිජව වගා කරන එළවළු, නිර්දේශිත ක්‍රම අනුව වගා කිරීම, නඩත්තුව හා අස්වනු නෙළීම ආදර්ශනය කරන වාණිජ එළවළු වගාව

10 ආහාරයට ගන්නා විවිධ ඖෂධ ගුණයෙන් හා පෝෂණ ගුණයන්ගෙන් යුත් විවිධ පලා සහ කොළ එළවළු වර්ග සහිත මැල්ලුම් උයන

11 ඉන්දුනීසියානු වගා තාක්ෂණ ක්‍රමයක් ආදර්ශනය කරමින් දුර්වල ජල වහනයක් සහිත භූමි, ඵලදායී ගොවිබිම් කරන සෝජාන් වගා ආදර්ශනය

12 පැරණි වී වර්ග හා නව වැඩිදියුණු කළ ප්‍රභේද ආදර්ශනය කර ඇති වී වගා දර්ශ එකතුව

13 වස විසෙන් තොර පෝෂණීය ආහාර වේලක් සඳහා කාබනික වගා ක්‍රම හා පාංශු සංරක්ෂණ ක්‍රම ආදර්ශනය සහිත කාබනික වගාව

14 සුවහසක් සිත් සනසන වැව් තාවුල්ල හා තොටුපල

15 වියළි කලාපීය ආදර්ශ ගෙවත්ත, කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතයෙන් තොරව, දේශීය පළිබෝධනාශක හා ජෛව පාලන ක්‍රම, කාබනික පොහොර භාවිතයෙන් ඉතා කාර්යක්ෂමව භූමිය උපයෝගී කරමින් ගෙවතු වගාව තිරසාරව සිදුකරන ආකාරය මෙහි ආදර්ශනය කර ඇත

16 ශ්‍රී ලාංකික රසය සහිත සාම්ප්‍රදායික අවන්හල (යෝජිත)

17 වැව් ඉස්මත්තේ නෙත් හා මනරම් පරිසරයේ ස්ථාපනය කර ඇති ශ්‍රවණාගාරය

18 බිගු පාලනයට අත්වැලක් සපයන ප්‍රදර්ශනාත්මක බිගු උයන

19 අඩු භූමි ප්‍රමාණයක පවුලේ ව්‍යාපාරික උද්‍යානය නිරූපනය කරන නාගරික ගෙවත්ත

20 ආරක්ෂිත බෝග වගාව පිළිබඳ තාක්ෂණය ආදර්ශනය සඳහා වැසි ආවරණ ගෘහය

21 ප්‍රදර්ශනාත්මක බිම්මල් ගෘහය

22 පැරණි හා නවීන කෘෂි යන්ත්‍රෝපකරණ, කෘෂි මෙවලම් වල විකාශනය පිළිබඳ තොරතුරු සහිත කෘෂි යන්ත්‍රෝපකරණ කෞතුකාගාරය



23 දේශීය අඹ ප්‍රභේදවල විවිධත්වය දක්වන අඹ උයන

24 විවිධ වර්ගවල ප්‍රභේද රාශියකින් යුත් අල වර්ග ඇතුලත් අලබෝග එකතුව

25 පස, ජලය, භූමිය සංරක්ෂණය අරමුණු කරගනිමින් වගා කරන වැඩි දියුණු කළ හේනක ආදර්ශනය

26 දේශීයව හමුවන විවිධ රෝග සඳහා ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ දී භාවිතාවන ඖෂධ පැළෑටි වලින් සමන්විත ඔසු උයන

27 කුළුබඩු, අපනයන බෝග හා නිෂ්පාදන ආදර්ශනය කර ඇති කුළුබඩු උයන

28 පැළ නිෂ්පාදන තාක්ෂණයන් විදහාපාන තවාන් පාලන ඒකකය

29 ශ්‍රී ලංකාවේ විවිධ කෘෂි පාරිසරික කලාපවල හමුවන කෙසෙල් ප්‍රභේද හා විවිධ වගා ක්‍රම ආදර්ශනය

30 ප්‍රභේද රාශියකින් යුත් කොස් දර්ශ එකතුව

31 වගා ක්‍රම, කප්පාදු ක්‍රම හා නඩත්තු කටයුතු ආදර්ශනය කරන වාණිජ වටිනාකම් සහිත පලතුරු වර්ග රාශියකින් යුත් පලතුරු උයන

32 පොදු සනීපාරක්ෂක පහසුකම් ගොඩනැගිල්ල

33 දොඩම් වගා ඒකකය

34 කාබනික පොහොර නිෂ්පාදන තාක්ෂණයන් ආදර්ශනය මෙන්ම උද්‍යානයේ කාබනික පොහොර අවශ්‍යතාවය සපුරාලන කාබනික පොහොර ඒකකය

35 වර්ෂාවෙන් එක්රැස් කර ගන්නා ජලය බෝග වගාවට කාර්යක්ෂමව යොදා ගන්නා අයුරු හා වැසි ජල සංරක්ෂණ ක්‍රම ආදර්ශනය කිරීම

36 යහපත් කෘෂිකාර්මික වත් පිළිවෙත් අනුව පවත්වාගෙන යනු ලබන ඩ්‍රැගන් ෆෘට් වගා ආදර්ශනය

37 නව තාක්ෂණ වී වගා ආදර්ශනය මගින් බීජ වී සංස්ථාපන ක්‍රම, වල් පාලන, රෝග හා පළිබෝධ පාලන ක්‍රම ආදර්ශනය

38 ළමා උද්‍යානය හා ව්‍යවසාය මධ්‍යස්ථානය (ඉදිකිරීමට යෝජිත)


*තාක්ෂණික උපදෙස්*

*ආර්. ඩබ්. කීර්ති කොඩිතුවක්කු, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ,*
*චමල් රාජපක්ෂ කෘෂි තාක්ෂණික උද්‍යානය, බටඅත*

*සැකසුම*

*ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නොරුව*

*මුද්‍රණය*

*කෘෂිකර්ම ප්‍රකාශන ඒකකය, ගන්නොරුව*


# චමල් රාජපක්ෂ කෘෂි තාක්ෂණ හා සංචාරක උද්‍යානය









## බටඅත


කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය - 2018

# කෘෂි තාක්ෂණ උද්‍යාන සැලැස්ම - බටඅත
# Agro Technology Park Map - Bataata




## හැඳින්වීම



ගන්නොරුව කෘෂි තාක්ෂණ උද්‍යානය ආදර්ශනය කර ගනිමින් රුහුණු පුරවරයට අභිමානයක් මෙන්ම අභියෝගයක් වෙමින් හරිත උයන් සංකල්පය මුදුන් පමුණුවාගත් ලංකාවේ දෙවන කෘෂි තාක්ෂණ උද්‍යානය බටඅත ග්‍රාමයට දායාද විය. එවකට කෘෂිකර්ම අමාත්‍ය ධූරය දැරූ චමල් රාජපක්ෂ මහතාගේ සහ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් රොහාන් විජේකෝන් මහතාගේ සංකල්පයක් මත ගොවීන්ගේ අභිවෘද්ධිය උදෙසා අක්කර 50කින් යුත් කෘෂි තාක්ෂණ උද්‍යානය 2008 වර්ෂයේ ජනතා අයිතියට පත් විය. සාම්ප්‍රදායික තාක්ෂණයේ පන්නරය ලබමින් නව තාක්ෂණික දැනුම හා කලාත්මක හැකියාව ඔපමට්ටම් කරමින් ස්වභාව සෞන්දර්යයේ උරුමය දායාද කරගත් වියළි දේශගුණික රාමුවකට සීමානොවූ බෝග විවිධාංගීකරණයකින් උද්‍යානය සංශිප්ත වී ඇත.

කෘෂි තාක්ෂණ උද්‍යානයට ප්‍රවිෂ්ට වීමේදී, කෘෂිකර්මාන්තය හා ගොවියා අතර සම්බන්ධතාවය නිරූපණය කරන ලොව ප්‍රථම ගොවිජන ස්මාරකය වන දෑත් යුගලය හා ශාක වලින් විවිධ මනරම් නිර්මාණයන් සහිත ඉදිරි පිවිසුමක් නිර්මාණය කරඇත.

## දැක්ම...

**කෘෂි තාක්ෂණ ආදර්ශණයෙන් විශිෂ්ඨත්වය**

## මෙහෙවර...

**සාම්ප්‍රදායික ගොවිතැන් ක්‍රම සහ ආර්ථික ඵලදායීතාවය සඳහා නව තාක්ෂණයන් පිළිබඳ දැනුම හා කෘෂිකර්ම ගොවිපොලක අත්දැකීම් ලබාදීම තුළින් තිරසාර කෘෂි සංවර්ධනයට උරදීම**

01 ඉදිරි පිවිසුමේදී ගොවීන්ගේ ගැටළු වලට අවශ්‍ය තාක්‍ෂණික සහය සපයන කෘෂි තාක්ෂණ හා තොරතුරු ඒකකය

02 දේශීය ආහාර සෞඛ්‍යාරක්ෂිතව සහ සහනදායී මිලකට ලබාදෙන හෙළබොජුන් හල

03 විවිධ සංස්කෘතික වැඩසටහන් සඳහා වූ එළිමහන් රඟහල

04 බීජ කෞතුකාගාරය (ඉදිකිරීමට යෝජිත)

05 උද්‍යානයට ප්‍රවිශ්ට වීමේදී, මානසික සුවය වර්ධනය සඳහා අලංකාර වූත් විවිධ වූත් මත්ස්‍ය වර්ග නැරඹුම් ස්ථානය හා විවිධ විවේක ස්ථාන පහසුකම් සලසා ඇති ජල උද්‍යානයක් වේ. ජලාශයට මුහුණලා ලාංකීය ජන සමාජයේ කෘෂි ආර්ථික රටාව පිළිඹිබු කරන කමත හා වී බිස්ස සහිත කෙත්වතු සමූහයකි

06 අලංකාර මල් ලියකම් ඇති මාර්ගය ඔස්සේ ගමන් කරන විට වාණිජව ප්‍රචලිත නොවූ, දේශීයව දක්නට ලැබෙන, පෝෂණීය ගුණයෙන් ඉතා ඉහළ ඌන භාවිත පලතුරු උයන වේ